UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

# විශ්වවිද්‍යාල රෝහල

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ස්ථිර පදනම මත

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වෛද්‍ය නිලධාරී**

1. වෛද්‍ය නිලධාරී – I ශ්‍රේණිය
2. වෛද්‍ය නිලධාරී – II ශ්‍රේණිය
3. වෛද්‍ය නිලධාරී – ප්‍රාථමික ශ්‍රේණිය

**හෙද නිලධාරී**

1. හෙද නිලධාරී – I ශ්‍රේණිය
2. හෙද නිලධාරී – III ශ්‍රේණිය

**පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලය**

1. ඖෂධවේදී – III ශ්‍රේණිය
2. විකිරණ ශිල්පී (රෝග විනිශ්චය) – III ශ්‍රේණිය
3. වාග් චිකිත්සක – III ශ්‍රේණිය

**පරිපාලන කාර්ය මණ්ඩලය**

1. මහජන සම්බන්ධතා නිලධාරී – II ශ්‍රේණිය
2. අලෙවිකරණ නිලධාරී – II ශ්‍රේණිය

**පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
5. මෙම තනතුරු ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය හා අනෙකුත් තනතුරු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරීන් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.
6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද, විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක් ද, දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව).
7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2023.02.21 දිනට හෝ ඊට පෙර " විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
8. අයදුම්කරුවන් කෙටි ලයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.
9. අසම්පූර්ණ, ප්‍රමාද වී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
10. අයදුම්පත් භාගත කර ගැනීමට/ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට (www.kdu.ac.lk) පිවිසෙන්න.

www.kdu.ac.lk